රඟ මඬල

කලාභූෂණ ගන්ධර්වතුමා. සංගීතඥ ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ විශිෂ්ඨ ශ්‍රේණියේ ගායන හා වාද්‍ය කලාවේදී.

ලයනල් ගුණතිලක ලියයි

ශ්‍රී ලංකාවේ ටවර් හෝල් යුගයේ, එනම් වර්ෂ 1911 සිට සිංහල නූර්ති නාට්‍ය කලාව පෝෂණය කළ නාට්‍යකරුවන්, සංගීතඥයින් හා නළු නිළියන්ගේ අප්‍රකට අනගි තොරතුරු අන්තර්ගත ලිපි මාලාව

පී.ටී.පී. ප්‍රේමචන්ද්‍ර සූරින්

ඇස ප්‍රිති කරන රූපා නැතිවි යතිය නොහැඟී නොදිරාවි නාමෙ සුන්දරා පවතී දනන්ගෙ හිත්හී
මෙම ලෝකේ පාපයේ ගැලි විසුවොත් දුක නියමයි
ත්‍රිවිධ ලෝක සැප ලැබීමටා පංච පාපයෙන් මිදිලා
මුනිඳුන් දෙසූ ඒ දහමා සිත්සේ රකිවි මෙත් පා
ත්‍රිවිධ ලෝක සැප ලැබීමටා පංච පාපයෙන් මිදිලා

අප කතානායකයාගේ මානාභරන නම් නූර්තියේ මෙම ගීතය පැරණි ගීත රසිකයන්ගේ හදවතේ රැඳුන ගීතයකි. එම ගීතය මෑත භාගයේ ආචාර්ය වික්ටර් රත්නායකයන් විසින් ගායනා කිරීමෙන් පසු නූතන පරපුරත් මනාව රසවිඳින බව පැහැදිලිව පෙනේ. එසේම එම ගීතය අතිශයින්ම ජනප්‍රිය වී ඇත.

ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රබෝධය ඇති කිරීමටත් ඇතැමුන්ගේ ජීවිත සංකර බවට පත්වී තිබුණු සමයක ජාතිවාත්ශල්‍යයන් හා පරසිරිත් පරිවම්හනය කිරීමේ දැඩි පරිශ්‍රමයකින් යුතුව එදා සිටි ජාතික වීරවරයන් ගෙන ගිය මෙහෙවර ඔස්සේ ගමන් කර ජාතියේ පුණර්ජීවනවය පිණිස පුවත්පත් කතුවරයෙකු ලෙස සිදුකර තිබෙන කාර්යභාරය අති විෂයාත්‍රිකාන්තය.

එකල කැළණියේ විසූ පී.එච්. පෙරේරා සෙනෙවිරත්න මුහන්දිරම් මහතාගේ කතෘත්වයෙන් පලකරන ලද ''දිනකර ප්‍රකාශය'' නම් පුවත්පතේ නියෝජ්‍ය කතුවරයෙකු ලෙස සේවයේ යෙදෙමින් සමාජ සංශෝධනය සඳහා ලිපි රාශියක් ලියා පලකලේය. ඒ 1915 වර්ෂයේදීය.

මෙතුමා ක්‍රි.ව. 1887 ජූලි මස 22 වන දින කොළඹට නුදුරු පෑලියගොඩ වෙළඳ ව්‍යාපාරික පී. සයිමන් පීරිස් අප්පුහාමි හා ඩබ්ලිව්. එලිසබත් රුඩිගෝ හාමිනේගේ පුත්‍රුවනක් ලෙසින් උපත ලැබීය. පෑලියගොඩ වත්තේ පන්සලේ ශ්‍රී ධර්මාරාම හිමිපාණන් ගෙන් සිංහල, පාලි, සංස්කෘත ආදී භාෂාවන් උගත්තේය.

සිංහල සමාජයේ සදාචාරයට හේතු වූ ගුණ දහම් පිළිබඳ වටහාදීම සඳහා සාරධර්ම ලිපි පල කිරීම නිසාම අනගාරික ධර්මපාල තුමන් විසින් මෙතුමන්ට ''ධම්මික ප්‍රේමචන්ද්‍ර'' නම් වූ ගෞරව නාමය පුදන ලදී. ලේඛන කලාවට මෙන්ම චිත්‍ර ශිල්පයටත් මනා ඇල්මක් දැක්වූ මෙතුමන් එකල අති ප්‍රසිද්ධ චිත්‍ර ශිල්පීන් වන රිචඩ් හෙන්රිකස්, පිලිප් රුඩිගෝ, ඕගන් රුඩිගෝ, යන චිත්‍ර ශාස්තඥයින්ගෙන් චිත්‍ර ශිල්පය ද හැදෑරුවේය.

නීතිඥ ජෝන් ද සිල්වා සූරින් මෙන්ම එකල ප්‍රසිද්ධ නාඩගම් කතුවරුන් වන සාමෙල් ඩයස්, ඩී.ජේ.ඩබ්ලිව්. ගුණතිලක ආදී කතුවරු ඇසුරෙන් ලත් ආභාෂයෙන් නූර්ති නාට්‍ය ක්ෂේත්‍රයට ද යොමු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රේමචන්ද්‍රයෝ නෘත්‍ය නාට්‍ය රාශියක් රචනා කර කරලියට නංවා තිබේ. ඊට අතිරේකව සිය නාටක වල ගීත මෙන්ම විකට ජවනිකා ඇතුලත් නාට්‍ය ගැයමෙන්න් තැටි ඔස්සේද ප්‍රචාරය කර තිබේ.

සාමජාතකය (1911), ලක්ෂණ සුලයිමන් (1911), ඉරණම (1911), සලෝනා (1913), පවුලක ඳෝගියා (1913), දහම්සොඩ (1913), සම්බුලා ජාතකය (1914), කාලිංග (1919), නීරෝ සහ සිසිලියා (1920), වර්ජිනියා (1920), මගුල්කපුවාට හෙන පහර (1924), බැබලෝනියාවේ කාන්තාව (1922), ශ්‍රී නිශ්ශංක (1924), රන්පිත් සිංහ (1926), චන්ද්‍රිකා (1926), ශ්‍රේෂියා දුටු ස්වප්නය හෙවත් නැවත ඉපදීම (1926), උතුවන්කන්දේ සරදියෙල් (1926), මාතලන් (1926), මානාභරණ (1926), විශාඛා (1927), රාජකවට අන්දරේ (1929), ශකරාජ චරිතය (1929), රාජ පොරොන්දුව (1931), විජය සුන්දරී හෙවත් පිටතින් ඇසෙන ශබ්දය (1929), ධවල කල්‍යාණී (1931), වීරගල බණ්ඩාර (1931), මායා තරංග (1931), ස්වර්ණ කේතු (1931), ගාමිණී මාතා හෙවත් විහාරමහා දේවී (1932), රෝහණ කුසුමා (1932), දෙමළ විගිළුව (1932), පෙම්බර ළමා (1933), සිංහල සිංහාසනය (1934), යන නාට්‍ය රචනාකර රඟදක්වා තිබේ. වෙසඟ ක්‍රීඩා සමාජයේ (1913) සාරදා නාට්‍ය සභාව (1913), සරස්වතී නාට්‍ය සභාව (1915), ගමිණීමාතා නාට්‍ය සභාව (1933), අභිනව ආර්යසිංහල නාට්‍ය සභාව (1919), ටවර්හෝල් හි ආර්ය සිංහල නාට්‍ය සභාව (1920), කොළඹ සිංහල නාට්‍ය සභාව (1928) යන නාට්‍ය සභාවල විවිධ කාර්යයන්හි නිරත වී සිටි බව පැහැදිලි වේ.

මෙතුමා විසින් රචිත නාට්‍ය සංඛ්‍යාව පිළිබඳව විමර්ෂනය කිරීමේදී මෙම ක්ෂේත්‍රයේ වර්ධනය පිණිස කෙතරම් වෙහෙසක් දරා තිබේද යන්න මනාව අවබෙධ කරගත හැක. වසර 67 ක් තුළ සිදුකර තිබෙන සමාජ සත්කාරයන් මෙන්ම විනෝදාස්වාදය ගෙන දීම සඳහා කර ඇති ප්‍රයත්නයන් මනාව පිළිබිඹු නොවන්නේද ?. මේ ක්ෂේත්‍ර කලාකරුවාණන් 1936 ඔක්තෝම්බර් මස 30 වන දින ජාතියෙන් සමුගත්තේය. මෙම උදාර මානව හිතවාදියා හදවතින්ම සැමරීම අපගේ යුතුකමකි.

ඉහතින් දක්වා ඇති ගීතයේ ප්‍රස්තාරය.
ස්ථායී
ඤදාඤදසම / ධ - - නි / ධ ප - ප / ග ප ගප ධනි / නි, නිස /

/ධ - - ප / මරි - ග/ප ධ ම -/ - - %% ධ ස/

/සි - - සි/නි - - ධ/නි රි සි - / සි සි සි - සි/

/නි සි නි රි සි නි/ධ ම ප ධ /ත්‍රි/ ධ ප - ප/ ග ප ග ධ නි/

/නි - නි සි / ධ - ප ම/ රි - - ග/ ප ධ ම -/

නොදිරාවි නාමෙ සුන්දරා යන කොටස ස්ථායි කොටසේ ස්වර ලෙසත්, මුනිඳුන් දෙසූ ඒ දහමා යන කොටස අන්තරා ස්වර ලෙසත් ගත යුතුයි. මෙම ගීතයේ ප්‍රස්තාරය සකස් කර ඇත්මේ මධ්‍යම ''ස'' කර බව සළකන්න.

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන
තිසර ගුවන්විදුලිය www.thisara.com

FOR ALL YOUR TRANSLATIONS
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

(ENGLISH SINHALESE)
Documents for immigration purposes

- BIRTH , MARRIAGE, DEATH
- EDUCATIONAL/ VOCATIONAL
- LEGAL and POLICE DOCUMENTS
- NATIONAL IDENTITY CARDS

CONTACT
DR. PREMA KUDALIGAMA
(BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com